වාර්ෂික වාර්තාව-සිංහල

2017

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල-සීදූව

පටුන

අන්තර්ගතය	පිටු අංකය

විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ ඓතිහාසික පසුබිම	03
ආයතනික තොරතුරු	04-05
ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන සභාපතිවරයාගේ ලිපිය	06
මානව සම්පත් සංවර්ධනය	07
රෝහල් සේවා විශ්ලේෂණය	08-14
2017 වසරේ ප්‍රධාන සාධනයන්	15
2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය	16-27
විගනකාධිපතිවරයාගේ සහතිකය හා විගනකාධිපති වාර්තාව (1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 14 (2) c වගන්තිය ප්‍රකාරව)	28-42

දැක්ම

අනගිතම සෞඛ්‍යාරක්ෂාවක් හා ආදර්ශ රෝහලක ආදර්ශය සැපයීම

මෙහෙවර

ප්‍රදේශයේ හා රටේ ජනයාගේ සෞඛ්‍ය අවශ්‍යතා පිරිමැසීම සඳහා පහසුකම් හා සේවක මඩුල්ල ඇපකැපව හා කාර්යක්ෂමව භාවිතා කිරීම. සාමාන්‍ය ශල්‍ය , අක්ෂි රෝග, දියවැඩියාව හා තුවාල සුව කිරීම යන ක්ෂේත්‍ර වල රාජ්‍ය තලයේ සෞඛ්‍ය තත්වයක් සැපයීම පිණිස රෝහලේ දැනට ඇති පහසුකම් දිගුකාලීනව වැඩිදියුණු කිරීම

සාමූහික අභිමතාර්තයන්

රෝහලේ අරමුණ වන්නේ ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණෙන පොදු ජනයාට කිසිදු පංති භේදයකින් තොරව අක්ෂි ප්‍රතිකාර, ශල්‍යමය හා දියවැඩියා කළමනාකරණය උසස් අන්දමින් සිදු කරමින් කාර්යක්ෂම සෞඛ්‍ය සේවා සැපයීම.

විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ 2017 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය
2017 ජනවාරි 01 සිට 2017 දෙසැම්බර් 31 දක්වා

ඓතිහාසික පසුබිම

විජය කුමාරතුංග අනුස්මරන රෝහල ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1999 නොවැම්බර් 12 වන දින පලකළ 1998 අංක 31 දරණ විජය කුමාරතුංග අනුස්මරන පදනම ලෙස හඳුන්වන පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත කර ඇත.

විජය කුමාරතුංග අනුස්මරන රෝහල 1988 පෙබරවාරි 16 වන දින ඝාතනය කළ විජය කුමාරතුංග මහතා සිහිවීම පිණිස පිහිටුවිනි. එවකට ජනාධිපති අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විජය කුමාරතුංග මහතාගේ මුල් ගම වන සීදූව ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් රෝහලක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘතිය දියත් කෙරිනි.

මෙම රෝහල ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක-සීදූව නගර සභා සීමාව තුල කොළඹ-මීගමුව ප්‍රධාන මාර්ගයේ සීදූවේ පිහිටි අක්කර තුනක ඉඩමක් විජය කුමාරතුංග අනුස්මරන පදනම මගින් ඉදි කෙරිනි. ආරම්භයේ දී රෝහල වාට්ටු දෙකින් (ඇඳන් 60) ක් හා බාහිර රෝගී අංශයක් සහිත වූ අතර සීදූවේ ජනයාට විශේෂයෙන්ම මූලික සෞඛ්‍යාරක්ෂණ ඒකකයක් බවට පත් විය. එවකට ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විජය කුමාරතුංග මහතාගේ උපන් දිනය වන 1999 ඔක්තෝබර් 09 දින රෝහල නිල වශයෙන් විවෘත කරන ලදී. රෝහලේ කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් දරණ අතර, අරමුදලේ ප්‍රධාන අරමුදල් ප්‍රවාහය සිදු කරනුයේ රජය මගිනි. අද වන විට රෝහල මගින් අක්ෂි ප්‍රතිකාර සේවා මෙන්ම වෙනත් තෘතීමය ප්‍රතිකාර ලබා දෙමින් විශාල ජනතාවකට සේවය සළසයි.

විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිපත්ති තීරණ ගනු ලබන අතර එහි මෙහෙයුම් හා එදිනෙදා කළමනාකරණය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1999 නොවැම්බර් 12 වන දින පලකළ 1998 අංක 31 දරණ විජය කුමාරතුංග අනුස්මරන පදනම ලෙස හඳුන්වන පාර්ලිමේන්තු පනතක් මගින් සිදු කෙරේ. විජය කුමාරතුංග අනුස්මරන රෝහල ප්‍රතිපත්තියක් ලෙස ලාභ තකා පිහිටවූ එකක් නොවනවා වුවද ඊට ආවේනික ගාස්තු ක්‍රමයක් ඇත. මෙහිදී ශෛල්‍යකර්ම සහ වැඩිදුර පරීක්ෂණ වැනි තෝරාගත් ක්ෂේත්‍ර තුල අයකිරීම් සිදු කරනුයේ පිරිවැය ආවරනය කර ගැනීම සඳහා පමණි. එසේ වුවද, අව වරප්‍රසාදිත ජනයාගෙන් මෙම සාධාරණ අයකිරීම් වුවද අය නොකෙරේ.

වැඩිදියුණු කිරීම් වල කොටසක් ලෙස, 2004 දි මූලිකව ඇරඹී සමස්ත ඇඳන් ප්‍රමාණය 148 ක් බවට පත් කරමින් ඇඳන් 88 කින් සමන්විත අක්ෂි වාට්ටුවක් සහිත වෙනම ගොඩනැගිල්ලක් තැනීම දියත් කර ඇත. ඒ අතර ජනයාට උසස් ප්‍රමිතියකින් යුතු සේවාවක් ලබා දීමේ අරමුණින් පවත්නා ප්‍රමිතීන් වැඩිදියුණු කර ශල්‍යාගාරයක් සහිතව පූර්ණ පහසුකම් වලින් යුතු අක්ෂි වාට්ටුවක් 2007 වසරේ දී අරඹන ලදී.

2012 වසරේ දී වර්ග අඩි 4,061 කින් යුත් වෙනම දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම අවසන් කර ඇති අතර එය සාමාන්‍ය ගබඩා, වෛද්‍ය වාර්තා ගබඩාව, රාජකාරී කාමර හා සම්මන්ත්‍රණ ශාලාවක් වැනි අංග වලින් සමන්විත වේ.

වර්ග අඩි 4386 ක බිම් ප්‍රදේශයක් සහිත තෙමහල් ගොඩනැගිල්ල ඉදි කිරීම 2015 වසරේ දි අවසන් කර ගැනීමට හැකි විය. එතුල රසායනාගාරය, තුවාල ප්‍රතිකාර ඒකකය, උපයෝගිතා කාමර වැනි පහසුකම් වැඩිදුර සැපයීම සිදු විය. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ (NERD) උපදෙස් මත රු. මිලියන 12.431 ක වියදමක් සහිතව තැනූ මෙම ගොඩනැගිල්ල 2015 සිට භාවිතා කෙරේ.
2016 වසර තුල ශල්‍ය ඒකකය පිහිටුවනු ලැබූ අතර ශල්‍ය වාට්ටුව රසායනාගාර ගොඩනැගිල්ලේ බිම් මහලේ ආරම්භ විනි. එන්ඩොස්කොපි යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම මගින් ශල්‍ය ඒකකයේ 2016 වසර තුල රෝගී ප්‍රතිකාර සේවාලබා දීම පුළුල් කෙරිනි.

2017 ජුලි මාසයේ දී 6 වන වාට්ටුව අක්ෂි ගොඩනැගිල්ලට වෙත මාරු කරන ලද අතර 2017 නොවැම්බර් මාසයේදී බාහිර රසායනාගාරය නව රසායනාගාර ගොඩනැගිල්ල තල ස්ථාපිත කෙරිනි.
යෝජිත වාට්ටු සංකීර්ණ ව්‍යාපෘතියේ ගොඩනැගිලි සැලසුම 2017 අග භාගයේ දී විශ්ලේෂණය කෙරිණ.
වර්තමානයේ වාට්ටු 5 ක් සහ ඇඳන් 124 ක් ඇත.

ආයතනික තොරතුරු
01-01-2017 ~ 31-12-2017

ආයතනයේ නම

විජය කුමාරතුංග අනුස්මරන රෝහල

ලිපිනය

විජය කුමාරතුංග අනුස්මරන රෝහල, සීදූව

කළමනාකාරිත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්

නෛතික ව්‍යුහය

1999 අංක 38 දරණ පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවා ඇත.

විගනකවරු

- විගනකාධිපති, විගනකාධිපති දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල
- අභ්‍යන්තර විගණන ඒකකය, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
  385, පූජ්‍ය බද්දේගම විමලවංශ මාවත,
  "සුවසිරිපාය"
  කොළඹ 10

අධ්‍යක්ෂ මණ්ඩලය
01-01-2017 ~ 31-12-2017

සභාපති

මහාචාර්ය කාලෝ පොන්සේකා

අධ්‍යක්ෂ මණ්ඩලය

- හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය
- වෛද්‍ය ජයසුන්ද බණ්ඩාර, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
- එන්.ඒ. උමගිලිය මයා, වෘත්තීය නියෝජිත
- ඩබ්.එච්.ජී. ගයාන් කෝසල මයා ,භාණ්ඩාගාර නියෝජිත , සහකාර අධයක්ෂ - කලමණාකරණ සේවා දෙපාර්තමේන්තුව
- චන්ද්‍රා වික්‍රමසිංහ මයා

විගණන කමිටුව

01-01-2017 ~ 31-12-2017

සභාපති

ඩබ්.එච්.ජී. ගයාන් කෝසල මයා, සහකාර අධ්‍යක්ෂ , කලමණාකරණ සේවා දෙපාර්තමෙන්තුව

නිරීක්ෂක

ආර්.ජී ඩී.ප්‍රියදර්ශනී මිය , ප්‍රධාන අභ්‍යන්තර විගණක, සෞඛ්‍ය පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශය
ආර්. එම්.කේ. කල්‍යාණී මිය, ගිණුම් අධිකාරි, විගනකාධිපති දෙපාර්තමේන්තුව

සාමාජික

වෛද්‍ය ඒස්.ආර්.යූ.විමලරත්න මහතා, අධ්‍යක්ෂ ,වි.ක.අ.රෝ.
සහභාගීත්වය – K.M.Y.K. කරුණාරත්න මිය, ගණකාධිකාරී ,වි.කු.අ.රෝ.

බැංකුකරුවෝ
ලංකා බැංකුව, සීදුව

ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
385, බද්දේගම විමලවංශ නාහිමි මාවත
"සුවසිරිපාය",
කොළඹ 10.

2017 වර්ෂය සඳහා වූ විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පාලක මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශය හා වාර්ෂික වාර්තාව

1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 14 (2) වගන්තිය අනුව, විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ පාලක මණ්ඩලය වෙනුවෙන් මම 2017 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පාලක මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශය හා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

ස්තුතියි.

මෙයට විශ්වාසී,

මහා. කාලෝ ෆොන්සේකා,
සභාපති,
විජය කුමාරතුංග අනුස්මරන රෝහල,
සීදූව.

පිටපත : ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

2017 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල වාර්තාව

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	සත්‍ය කාර්ය මණ්ඩලය
අධ්‍යක්ෂ	1	1
නිර්වින්දන වෛද්‍ය විශේෂඥ	1	1- මුදා හැරීම්
කායික රෝග විශේෂඥ වෛද්‍ය	2	1
ශල්‍ය වෛද්‍ය විශේෂඥ	1	1
අන්තරාසර්ග වෛද්‍ය විශේෂඥ	1	0
අක්ෂි ශල්‍ය වෛද්‍ය විශේෂඥ	2	1
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	1	1
වෛද්‍ය නිලධාරී	26	19
දන්ත ශල්‍ය වෛද්‍ය	2	1
අභ්‍යන්තර විගණක	1	0
ගණකාධිකාරී	1	1
ලියාපදිංචි වෛද්‍ය නිලධාරී	2	3
විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරිනී	1	1
හෙද සොයුරී	2	2
හෙද නිලධාරී	81	73
පරිපාලන නිලධාරී	1	1
ඖෂධවේදී	6	5
විකිරණශිල්පී	2	1
වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ	5	3
අක්ෂි තාක්ෂණවේදී	4	4
පෝෂණවේදී	1	0
වැඩ මූලික	1	0
වායු සමීකරණ කාර්මික ශිල්පී	1	0
විද්‍යුත් බන්තු රේඛණ ශිල්පී	1	1
කළමණාකරණ සහකාර	7	7
ඖෂධ සංයෝජක	3	3
ගබඩා භාරකරු	1	1
පොත් තබන්නා	1	1
යතුරු ලියන්නා (සිංහල / ඉංග්‍රීසි)	2	0
ආහාර නිරීක්ෂිකා	1	1
නිවාස භාරකාරිනී	1	0
වෛද්‍ය ලේඛණාගාර සහකාර	1	1
රියදුරු	5	3
විදුලි කාර්මික	1	1
නඩත්තු කම්කරු	3	3
Lab0rderly	2	0
උරක්කැම්	3	2
දුරකථන ක්‍රියාකරු /පිළිගැනීමේ නිලධාරිනී	3	0
සෞඛ්‍ය කාර්ය සහයක	69	68
Total	250	211

රෝහල මගින් ලබා දෙන සේවා

හැඳින්වීම

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල මගින් බාහිර ප්‍රතිකාර සේවා හා අභ්‍යන්තර ප්‍රතිකාර සේවා යන දෙවර්ගයම ලබා දේ. බාහිර රෝගී දෙපාර්තමේන්තුව (OPD), හදිසි ප්‍රතිකාර ඒකකය (ETU), එන්ඩොස්කොපි ඒකකය හා විශේෂිත සායන මගින් බාහිර ප්‍රතිකාර සේවා සළසා දේ. වෛද්‍ය, සැත්කම්, අක්ෂි හා තුවාල සත්කාරක වාට්ටු හා ශල්‍යාගාර මගින් අභ්‍යන්තර සේවා සළසා දේ. 2017 වසරේ වාට්ටුගත ව ප්‍රතිකාර ලබා ගත් ප්‍රමාණය 53.65% ක් විය.

රෝගී ප්‍රතිකාර සේවා සඳහා රෝහලේ පිහිටි බෙහෙත්ශාලාව, එක්ස් කිරණ ඒකකය, වෛද්‍ය රසායනාගාරය හා ඊසීජී ඒකකය ඉවහල් වේ. විශේෂිත නොවන මෙන්ම විශේෂිත සේවා රෝහල මගින් මහජනයාට ලබා දේ. රෝහලේ දැනට ඇති පහසුකම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ බී වර්ගයේ මූලික රෝහලක ඇති පහසුකම් වලට සමානවේ.

අභ්‍යන්තර කළමනාකරනය අවශ්‍ය වන වෛද්‍ය, සැත්කම් හා අක්ෂිමය සංකූලතා සහිත රෝගීන් බාහිර රෝගී අංශය, හදිසි ප්‍රතිකාර ඒකකය හා විශේෂිත සායන වලින් වාට්ටු වලට ඇතුළත් කෙරේ. MRI, CT ස්කෑන් වැනි විශේෂ පරීක්ෂණ අවශ්‍යවන රෝගීන්ව ජාතික රෝහල, රාගම උතුරු කොළඹ ශික්ෂණ රෝහල වැනි රෝහල් වලට යොමු කෙරේ.

- <u>බාහිර රෝගී දෙපාර්තමේන්තුව (OPD)</u>

රෝහලේ බාහිර රෝගී දෙපාර්තමේන්තුවට පැමිණෙන රෝගීන්ගෙන් වැඩි දෙනෙකු පැමිණෙන්නේ කඳාන, ජා ඇල හා කටුනායක වැනි ප්‍රදේශ වලිනි. කටුනායක අපනයන සැකසුම් කලාපයේ කාර්ය මණ්ඩල ද ඒ අතර වේ. ඊට අමතරව,මිනුවන්ගොඩ හා ගම්පහ ප්‍රදේශ වලින්ද ප්‍රතිකාර තකා රෝගීන් මෙම රෝහලට පැමිණේ.

2017 වසර තුල බාහිර රෝගීදෙපාර්තමේන්තුවේ ප්‍රතිකාර ලැබූ මුළු සංඛ්‍යාව **117,080** ක් වූ අතර දිනක සාමාන්‍යය රෝගීන් **324** ක් විය. බාහිර රෝගී දෙපාර්තමේන්තුවේ ප්‍රමාණවත් වෛද්‍යවරුන් නොමැතිවීම මෙම වසරේ එම දෙපාරේතමේන්තුව තුල ඇති අඩුපාඩු වලින් එකකි.

1 වන වගුව මගින් බාහිර රෝගී දෙපාර්තමේන්තුව සම්බන්ධන පසුගිය වසර තුල තත්වය විදහා දක්වේ.

- <u>හදිසි ප්‍රතිකාර ඒකකය (ETU)</u>

පැය විසිහතර පුරා විවෘතව ඇති හදිසි ප්‍රතිකාර ඒකකය මගින් රෝහලට ගෙන එන හදිසි ප්‍රතිකාර සියල්ලට සත්කාර සැලසේ. මාර්ග අනතුරු, කාර්මික අනතුරු හා අපනයන සැකසුම් කලාපයේ ඇති වන කර්මාන්තශාලා අනතුරු හා ගෘහස්ත හදිසි අනතුරු වලින් පීඩාවට ලක්වන්නන් හදිසි ප්‍රතිකාර ඒකකයට රැගෙන එනු ලැබේ. දරුණු හදිසි අනතුරු වලට ප්‍රතිකාර කරන අතර විශේෂිත සත්කාර අවශ්‍ය වන රෝගීන් අදාල වාට්ටු වෙත යොමු කෙරේ. වෛද්‍ය, සැත්කම් හා අක්ෂිමය ප්‍රතිකාර අවශ්‍ය කරන රෝගීන් විශේෂිත ප්රතිකාර සඳහා ආසන්නයේ ඇති රෝහල් වෙතට යොමු කෙරේ. විශේෂ වෛද්‍යවරයෙකු මෙම ඒකකය තුල සිටින බැවින් වෛද්‍ය වාට්ටුවලට යැවීමට පෙර දින ගණනාවක් දැඩි සත්කාර අවශ්‍ය කරන රෝගීන් ප්‍රතිකාර ලබා දේ.

උදාහරණයක් ලෙස,හදවත් ආබාධ/ කිරීට සින්ඩ්‍රෝම් හා මාරාන්තික සිටින නියුමෝනියා රෝගීන් රෝහලේ H.D.U නොමැති බැවින් පරීක්ෂා කිරීම් සඳහා හදිසි ප්‍රතිකාර ඒකකයේ තබා ගැනේ.

හදිසි ප්‍රතිකාර ඒකකයෙන් 2017 වසර තුල ප්‍රතිකාර ගත් මුළු රෝගී සංඛ්‍යාව **23,054** ක් විය.හදිසි ගත වූ වසර 5 ට අදාළව ප්‍රතිකාර ඒකකයේ සංඛ්‍යා ලේඛන 1 වගුව තුල දක්වා ඇත.

- දන්ත ඒකකය

දන්ත ඒකකය සඳුදා සිට සෙනසුරාදා දක්වා රෝගීන් සඳහා විවෘතව තැබේ. සෙනසුරාදා දිනවල පාසැල් සිසුන් සඳහා ප්‍රමුඛත්වය ලබා දේ.

සාමාන්‍ය දන්ත ප්‍රතිකාර, දත් ගැලවීම්, පිරවීම් සහ කම්පනය, කාලීන ප්‍රතිකාර, පීඩොඩොන්ටික් ප්‍රතිකාර, සුළු සැත්කම් කටයුතු වැනි හදිසි දන්තා ආබාධ සායන තුලදී සිදු කෙරේ. මීට අමතරව, ප්‍රතිසංස්කරණ හා ඉදිරියට නෙරා ඇති දත් සැකසීම ද සිදු කෙරේ.

මුඛයෙන් සියැටිස් ඉවත් කිරීම, පළුදු වූ 3 වන මොලර් ඉවත් කිරීම සහ කැනීස් දන්ත සායනය තුල සිදු කරන සිළු සැත්කම් අතර කිහිපයකි.

2017 වසර තුලදී දන්ත ඒකකයට පැමිණි සමස්ත රෝගී සංඛ්‍යාව 7556 ක් විය. ගත වූ වසර 5 තුල දන්ත ඒකකයේ සංඛ්‍යාලේඛන 1 වගුව තුල දක්වා ඇත.

- වෛද්‍ය ඒකකය

ඇඳන් 35 කින් යුතු පිරිමි වාට්ටුවක් හා ඇඳන් 30 කින් යුත් කාන්තා වාට්ටුවක් වෛද්‍ය ඒකකය සතුව ඇත. වෛද්‍ය ඒකකය සඳුදා සිට සෙනසුරාදා දක්වා සායන පවත්වනු ලැබේ. දියවැඩියාව,අධි රුධිර පීඩනය , ඇදුම වැනි රෝගීන්හටද මෙම සායනයේදී ප්‍රතිකාර ලබා දේ.
2017 වසර තුල මෙම වෛද්‍ය සායනයෙන් සේවා ලබාගත් මුළු රෝගී සංඛ්‍යාව 43,180 ක් විය. ගතවූ පස් වසර තුල වෛද්‍ය සායනය, වාට්ටු අංක 1 හා 2 ට සම්බන්ධන සංඛ්‍යාලේඛන 2 වන වගුව තුල දක්වා ඇත.

- Visiting clinic ජංගම සායන පැවැත්වීම

රෝහලේ බාහිරවිශේෂඥ වෛද්‍යවරුන් විසින් පවත්වන සායන දෙකක් විශේෂිත ළමා සායනය, දියවැඩියා හා අධික රුධිර පීඩන සායනය සතිපතා පැවැත්විනි. 2017 වසර තුල දියවැඩියා හා අධික රුධිර පීඩන සායනය සඳහා මුළු රෝගී සංඛ්‍යාව පිළිවෙලින් 1145 හා 3046 ක් විය.
ගත වූ වසර පහ තුල බාහිර සායන වල දත්ත 3 වන වගුව තුල දැක්වේ.

- වෙනත් සායන

මීට අමතරව,මානසික රෝග සායනය, බෝ නොවන රෝග(NCD) සායනය හා ප්‍රසව හා පවුල් සංවිධාන සායනය සතිපතා ශ්‍රේණිගත වෛද්‍ය නිලධාරීන් විසින් සිදු කෙරිනි. මානසික රෝග හා බෝ නොවන රෝග සායන මගින් 2017 තුලදී පිළිවෙලින් රෝගීන් 2609 කට හා 566 දෙනෙකුට ප්‍රතිකාර ලබා දී ඇත.
ගතවූ වසර පහ තුල වෙනත් සායන වල දත්ත 4 වන වගුව තුල දැක්වේ.

- ශල්‍ය ඒකකය

2016 මැද භාගය වන විට ශල්‍ය ඒකකය අලුතින් පිහිටුවන ලදී.ඇ දන් 6 ක් සහිත වාට්ටුවකින් හා ශල්‍ය සායනයකින්ද ද , එක් විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකුගෙන් හා ඒක් වෛද්‍ය නිලධාරියෙකුගෙන් ද සමන්විත විය.UGIE සහ LGIE ඒනඩොස්කොපි පහසුකම් සහිත ඒන්ඩොස්කොපි යන්තයක් 2016 වසර අගදී ශල්‍ය ඒකකය වෙත පරිත්‍යාග කරන ලදී .

2017 දී ශල්‍ය වාට්ටුව ඇඳන් 24 කින් සමන්විත වූ වඩා ඉඩකඩ සහිත වාට්ටුවකට මාරු කරන ලද අතර තවත් වෛද්‍ය නිලධාරියෙක් ද අනුයුක්ත කරන ලදී.2017 වසරේදී ශල්‍ය සායනයේ මුලු රෝගීන් සංඛ්‍යාව 3697 (පලමු පැමිණීම්) විය. ශල්‍ය ඒකකය විසින් මුලු ශල්‍යකර්ම 889 ක් සිදු කරන ලද අතර ප්‍රධාන ශල්‍යකර්ම 573 ක් හා සෙසු ශල්‍යකර්ම 316 ක් විය .

එන්ඩොස්කොපි ඒකකය මගින් duplex scans 253 ක්ද , breast scans 60 ක් ද ,Varicose Veins සඳහා sclerotherapy procedures 253 ක් ද සිදු කර ඇත.එසේම PRP (Platelet Rich Plasma Therapy) injections 114 ක්ද , MP (Methyl Prednisolon) Injections 36 ක්ද , FNAC (Fine Needle Aspiration පටිපාටි 72 ක්ද . ශල්‍ය ඒකකයේ ඒන්ඩොස්කොපි අංශය විසින් Endoscopy පරීක්ෂණ 665 ක්ද සිදු කර ඇති අතර ඉන් UGIE (Upper Gastro Intestinal Endoscopy) procedures 136 ක්ද , LGIE (lower Gastro Intestinal Endoscopy) 221ක්ද ,colonoscopies 11 ක්ද , proctoscopy 275 ක් ද විය .මෙ අතර RBL(Rubber band ligation for hemorrhoids) procedures 97 ක් හා sclerotherapy Injections for haemorrhoids 40 ක් ද විය

- <u>තුවාල ප්‍රතිකාර ඒකකය</u>

මෙම රෝහලේ තුවාල ප්‍රතිකාර ඒකකය රටේ ප්‍රමුඛ නමක් දිනා ගැනීමට සමත් වී ඇති අතර රටේ සතර දිග්භාගයේන්ම රෝගීන් මෙම රෝහලට ප්‍රතිකාර ගැනීම් සිදු වෙමින් පවතී. සායනයට අමතරව අභ්‍යන්තර වාට්ටුවක් මෙම ඒකකය තුල පවතින බැවින් වෙනත් රෝහල්වල තුවාල බෙහෙත් ගැල්වීමේ සායන වලට වඩා තුවාල ප්‍රතිකාර ඒකකය වෙනස් වේ.

තුවාල සඳහා wound debridement අවශ්‍ය කරන රෝගීන් හට මෙම ඒකකයෙන් ප්‍රතිකාර කරන අතර ශල්‍යාගාර තුල සැත්කම් කළයුතු රෝගීන්ව රාගම උතුරු කොලඹ ශික්ෂණ රෝහල, මීගමුව දිස්ත්‍රික් මහ රෝහල ට සහ කොළඹ ජාතික රෝහලට යොමු කෙරේ. අවශ්‍ය ක්‍රමවේද වලින් අනතුරුව මෙම රෝගීන් සාමාන්‍ය පරිදි ඒකකය වෙත යැවේ.
මෙම ඒකකය මගින් වෛද්‍යවරුන් හා හෙද නිලධාරින් හට පුහුණුවීම් ලබා දේ.
මෙම ඒකකයේ ප්‍රමාණාත්මක වර්ධනයට වඩා ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ප්‍රමුඛත්වය දෙනු ලැබෙ.
මෙම ඒකකයට අනුයුක්ත වෛද්‍ය නිලධාරිවරයා තුවාල සුව කිරීමේ හා පඨක අළුත්වැඩියා කිරීමේ ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීමට වසර 2 ක කාලයක් නිවාඩු ලබා ඇත.
ගත වූ වසර පහ තුල තුවාල සත්කාර ඒකකයේ දත්ත 6 වන වගුව තුල දැක්වේ.

- <u>අක්ෂි ඒකකය</u>

අක්ෂි ඒකකය සතුව අක්ෂි සායනය, අක්ෂි වාට්ටු දෙකක් හා අක්ෂි ශල්‍යාගාරයක් ඇතුළත් වේ. අක්ෂි සැත්කම් ශල්‍යාගාර අක්ෂි සායන ඉරිදා හා ප්‍රසිද්ධ නිවාඩු දිනවල හැර අන් සෑම දිනකම ව්වෘතව ඇත. කලින් වේලා වෙන් කරගැනීමක් අවශ්‍ය නොවන අතර පරීක්ෂා කර ගැනීම් කර ගැනීම සඳහා රෝගීන්ට පැමිණිය හැක.
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් අනුව අක්ෂි වාට්ටුවේ පරිභෝජනයට නොගත් ඇඳන් 40 ක් ඩෙංගු රෝගීන් සඳහා භාවිතයට මීගමුව රෝහලේ දිස්තික් මහ රෝහල වෙත මාරු කර ඇත.අක්ෂි සායනයෙහි නව රෝගීන් දිනකට 60ද පැරණි රෝගීන් 60 දෙනෙකුට පමණක් සීමාවී තිබුණද, හදිසි අවස්ථා සීමා නොකලේය.අක්ෂි වෛද්‍යය ඒකකය සාමාන්‍යය අක්ෂි සායනය, ළමා අක්ෂි සායනය සහ පශ්චාත් ශල්‍යකර්ම සායන පවත්වන ලදී.

අක්ෂි ඒකකය තුල Fundus Fluorescein Angiography, නෙරපුම් අංශ ඡායාරූපකරණය, A ස්කෑන් / contact biometry, B ස්කෑන්, OCT (Optical Coherence Tomography) ඩිස්ක් හා මැකියුලා, ටොපෝග්‍රැපි, මූලික ඡායාරූපමය පරීක්ෂණ පහසුකම් සළසා ඇත.
අක්ෂි ඒකකය තුල සාමාන්‍ය සේවාව වලට අමතරව හදිසි ප්‍රතිකාර සේවා පැය විසි හතර පුරා පැවැත්විය.

සිදු කළ සැත්කම් සංඛ්‍යාව වාට්ටුවේ ඇති ඇඳන් සංඛ්‍යාව ඉක්ම වුවද දුර බැහැර පළාත් වලින් පැමිණෙන රෝගීන් වැඩි ප්‍රමාණයක් සැත්කම් කළ දිනම මුදා හැර ඇත.

රෝගී සේවාවන් පිළිබඳ සාරාංශගත විස්තරය

2017 වසර තුල අක්ෂි ඒකකයේ කාර්ය සාධනය පහත දක්වා ඇත.

ක්‍රියාවිද වර්ගය	රෝගීන් සංඛ්‍යාව
වාට්ටු ඇතුළත් කිරීම	3,129
සායන සහභාගීත්වය	49,423
සිදුකළ සැත්කම්	1,994
ලබාදුන් ලේසර් ප්‍රතිකාර	962
සුදුඉවත් කිරීම	7,484
අක්ෂි කඳවුරු වලට සහභාගීවූ රෝගීන්	0

ගතවූ පසර පහ තුල සිදු කළ අක්ෂි සායන, අක්ෂි සැත්කම්, ලේසර් ප්‍රතිකාර හා ඇසේ සුද ඉවත් කිරීම් පිළිබඳ සංඛ්‍යාලේඛන 5 වන වගුවේ දක්වා ඇත.

සහායක සේවා

වෛද්‍ය රසායනාගාරය

වෛද්‍ය රසායනාගාරය සතුව මූලික රසායනාගාර පරීක්ෂා කිරීමේ පහසුකම් ඇත. 2017 වසරේ දී සෙරම් ඉලෙක්ට්‍රොලයිට්ස්, ට්‍රොපොනින් I හා C. ප්‍රතික්‍රියක ප්‍රෝටීන් (CRP-quantitative)සඳහා රසායනාගර පහසුකම් සලසා දී ඇත. වෛද්‍ය රසායනාගාරය තුල වෛද්‍ය රසායනාගාර කාර්මිකණ්ඩ තිදෙනෙක් අනුයුක්තවඇත.
2017 වසරේ සිදු කල රසායනාගාර පරීක්ෂණ මුළු සංඛ්‍යාව 90,605 ක් වූ අතර ඒය පසුගිය වසරට සාපේක්ෂවසීඝ වර්ධනනයක් පෙන්නුම් කරයි.

ECG

විද්‍යුත් හෘද රේඛණ ශිල්පියෙකු විසින් මෙහෙයවන ඊසීජී (ECG) ඒකකය මගින් බාහිර රෝගීන්ට මෙන්ම නේවාසික රෝගීන්ට ප්‍රතිකාර සැපයේ. සිදු කල මුලු මුළු ඊසීජී පරීක්ෂණ සංඛ්‍යාව 7,344 ක් විය.

එක්ස් කිරණ

එක් විකිරණ ශිල්පියෙකුගෙන් සමන්විත එක්ස් කිරණ ඒකකය සියළු වර්ගවල ශාරීරික එක්ස් කිරණ ලබා ගැනීමට පහසුකම් වලින් සමන්විතව ඇත. 2017 වසර තුල ලබා ගත් එක්ස් කිරණ සංඛ්‍යාව 2,796 ක් විය.

ගතවූ පස් වසරේ සහායක සේවා පිළිබඳ සංඛ්‍යා ලේඛන 7 වන වගුව තුල දක්වා ඇත.

1 වගුව

අංශය /වසර	ප්‍රතිකාර ලැබූ මුලු රෝගීන් සංඛ්‍යාව				
	2013	2014	2015	2016	2017
බාහිර රෝගී අංශය	135,796	136,416	138,194	131,953	117,080
හදිසි පතිකර අංශය	18,518	18,651	21,232	20,901	23,054
දන්ත ඒකකය	8,311	8,412	8,234	8,057	7,566

2 වගුව
වෛද්‍ය අංශය

අංශය /වසර	ප්‍රතිකාර ලැබූ මුලු රෝගීන් සංඛ්‍යාව				
	2013	2014	2015	2016	2017
වෛද්‍ය සායනය	24,862	28,625	34,763	43,282	43,180

අංශය /වසර	ප්‍රතිකාර ලැබූ මුලු රෝගීන් සංඛ්‍යාව				
	2013	2014	2015	2016	2017
වෛද්‍ය වාට්ටු අංක 1-පිරිමි	1,320	1,436	1,659	1,541	1,541
වෛද්‍ය වාට්ටු අංක 2-ගැහැණු	1,668	1,727	2,028	1,973	1802

3 වගුව
බාහිර විශේෂඥවරුන් පවත්වන සායන

අංශය /වසර	ප්‍රතිකාර ලැබූ මුලු රෝගීන් සංඛ්‍යාව				
	2013	2014	2015	2016	2017
දියවැඩියා අධි රුධිර පීඩන සායන	1,718	2,158	2,689	2,346	3,046
ළමා රෝග සායනය	1,927	1,715	1,355	1,295	1,145
මානසික රෝග සායනය	2,014	2,037	2,252	2,056	2,609

4 වගුව
වෙනත් සායන

අංශය /වසර	ප්‍රතිකාර ලැබූ මුලු රෝගීන් සංඛ්‍යාව				
	2013	2014	2015	2016	2017
බෝ නොවන රෝග සායනය	-	-	183	49	566

5 වගුව
අක්ෂි අංශය

අංශය /වසර	ප්‍රතිකාර ලැබූ මුළු රෝගීන් සංඛ්‍යාව				
	2013	2014	2015	2016	2017
අක්ෂි සායනය	65,642	63,983	72,579	69,338	49,423
අක්ෂි ශල්‍යකර්ම	10,247	11,514	11,341	10,910	1,994
Laser ප්‍රතිකාර	2,228	1,900	1,984	1,943	962
Refractive පරීක්ෂණ	14,462	17,949	17,393	15,193	7,484

6 වගුව
ශල්‍ය අංශය

අංශය /වසර	ප්‍රතිකාර ලැබූ මුළු රෝගීන් සංඛ්‍යාව				
	2013	2014	2015	2016	2017
ශල්‍ය සායනය	1,145	727	747	2,415	3.697
සාමාන්‍ය ශල්‍යකර්ම	141	109	109	477	889
තුවාල සත්කාර ඒකකය	6,069	14,483	23,114	24,221	19,926

7 වගුව
සහයක සේවාවන් /පරිපූරක වෛද්‍ය සේවාවන්

අංශය /වසර	මුළු පරීක්ෂණ සංඛ්‍යාව				
	2013	2014	2015	2016	2017
රසායනාගාර පරීක්ෂණ	34,082	47,157	57,138	59,178	90,605
එක්ස් රේ පරීක්ෂණ	3,424	4,535	5,505	5,478	2,796
ECG පරීක්ෂණ	3,005	3,408	3,014	4,303	7,344

✓ සෞඛ්‍ය අමාත්‍යාංශ වාර්තා වලට අනුව **2017** වසර ත තුළ රෝගීන් ප්‍රධාන රෝහල්ගතවීම්

රෝගය	මුළු රෝහල්ගතවීම් රෝගීන් සංඛ්‍යාව
Cataract and other disorders of lens	1757
Dengue fever	571
Essential hypertension	571
Other viral diseases(includes viral fever)(A81,A88,A89,B00,B03,B04,B0709,B25,B27B34)	525
Noninsulin dependent diabetes mellitus	455
Insulin dependent diabetes mellitus	429
Varicose veins of lower extremities	376
Asthma	358
Infections of skin and subcutaneous tissue	354
Diarrhoea and gastroenteritis of presumed infectious origin	286
Gastritis and duodenitis	219
Other diseases of skin and subcutaneous tissue	218
Other ischaemic heart disease	189
Other diseases of the urinary system (N13N15, N25N28,N30N39,N99.0,N99.1,N99.4,N99.5)	178
Acute bronchitis	177
Other disorders of musculoskeletal system	168
Persons encountering health services for examination, investigation and for specific procedures of health care	158
Pneumonia	156

✓ **විශේෂ අවස්ථා**

✓ වාර්ෂික ලේ දන්දීමේ ව්‍යාපාරය 2017 පෙබරවාරි 16 දින පැවැත්විනි.

2017වසරේ ප්‍රධාන සිදුවීම්

2017 වසර තුල පහත දැක්වෙන මිලදී ගැනීම් සිදු කෙරිනි.

A) පරිත්‍යාග

Pulse Oxymeter දෙකක් -රු . 230,000.00

B) මිලදී ගැනීම්

1) <u>වෛද්‍ය උපකරණ-</u>

Equipment	Quantity	Amount (Rs.)
Diathermy Machine	01	1,575,000.00
Dental Chair	01	1,472,000.00
Infusion Pump	03	196,650.00
ECG Machine	01	62,500.00
Medical Instrument from MSD		3,722,343.05

2) <u>ලිපිද්‍රව්‍ය සහ සවිකිරීම්</u>

ලිපිද්‍රව්‍ය සඳහා වූ මුලු මුදල රු. 404,476.00ක් විය.

3) <u>යන්ත්‍ර හා විදුලි උපකරණ</u>

යන්ත්‍ර හා විදුලි උපකරණ මිලදී ගැනීම සඳහා වියදම් කළ මුළු මුදල රු. 409,583.00ක් විය

4) <u>පරිගණක උපකරණ</u>

පරිගණක උපකරණ සඳහා වියදම් කළ මුළු මුදල රු. 896,750.00ක් විය

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

මූල්‍ය තත්වය ප්‍රකාශනය

2017 දෙසැම්බර් 31 දිනට

		2017	2016
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් වලට සමාන දෑ	1	30,066,808.38	24,372,078.77
ලැබීමට නියමිත දෑ /උපචිත ලැබීම	2	8,674,230.10	8,564,929.60
තොග	3	17,441,514.45	18,636,219.19
පූර්ව ගෙවීම්	4	72,000.00	265,685.14
		56,254,552.93	51,838,912.70
ප්‍රාග්ධන කාරක ප්‍රගතිය	5	662,076.27	662,076.27
ජංගම නොවන වත්කම්			
යටිතල පහසුකම් , පිරියත හා උපකරණ	6	63,034,084.94	69,988,186.59
ඉඩම් හා ගොඩනැගිලි	7	166,798,849.62	170,074,857.03
		229,832,934.56	240,063,043.62
		286,749,563.76	292,564,032.59
මුලු වත්කම්			
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවීමට ඇති දෑ	8	7,843,524.58	17,248,517.69
ණය ගැතියෝ	9	32,546,421.94	42,331,803.89
පාරිතෝෂිත ප්‍රතිපාදන	10	26,473,245.50	22,164,890.64
සමස්ථ බැරකම්		66,863,192.02	81,745,212.22
ශුද්ධ වත්කම්		219,886,371.74	210,818,820.37
ශුද්ධ වත්කම් ස්කන්ධය			
ප්‍රාග්ධනය	11	75,787,890.44	75,787,890.44
රාජ්‍ය ප්‍රදාන-ප්‍රාග්ධන	12	166,050,034.26	172,358,655.36
පරිත්‍යාග	19	12,635,376.03	12,221,026.03
සංචිත -ප්‍රාග්ධන වාසි		2,131,366.30	2,131,366.30
සමුච්චිත අතිරික්තය-(හිග)	13	(36,718,295.29)	(51,680,117.76)
ශුද්ධ වත්කම්/සම කොටස් එකතුව		219,886,371.74	210,818,820.37

මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැදී සිටින අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩය වෙනුවෙන් අත්සන් කරන ලදී.

....
සභාපති
දිනය

....
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
දිනය

....
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
දිනය

....
ගණකාධිකාරි
දිනය

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය
2017 දෙසැම්බර් 31 දිනට

		2017	2016
ආදායම්			
රාජ්‍ය ප්‍රදාන (පුනරාවර්තන)		293,000,000.00	240,000,000.00
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය		24,608,621.10	25,339,772.78
වෙනත් ආදායම්	14	11,268,920.21	22,415,006.86
සමස්ත ආදායම		**328,877,541.31**	**287,754,779.64**
වියදම්			
කුලී වැටුප්හා සේවක සුභසාධන	15	182,502,616.88	150,585,999.43
සැපයුම් හා භාවිත දෑ	16	71,596,141.29	79,055,069.76
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම	17	25,226,085.56	25,339,772.78
වෙනත් වියදම්	18	35,283,539.11	35,865,083.56
සමස්ත වියදම්		314,608,382.84	290,845,925.53
අතිරික්තය / (හිග) අදාල කාලයේ		**14,269,158.47**	**(3,091,145.89)**

විජය කුමාරතුංග අනුස්මරන රෝහල - සීදූව

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය - 2017දෙසැම්බර් 31අවසන් වන වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රවාහ - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්	
අතිරික්තය / (හිග)	14,269,158.47
මුදල් නොවන මාර්ග	
ක්ෂය	25,226,085.56
ක්‍රමක්ෂය - රාජ්‍ය ප්‍රදාන	(24,608,621.10)
වැඩිවීම - ගෙවීමට ඇති දෑ	(9,419,993.11)
වැඩිවීම - ණයගැතියෝ	(9,785,381.95)
වැඩිවීම - තොග	1,194,704.74
අඩුවීම - සේවක පිරිවැයට අදාල ප්‍රතිපාදන	4,308,354.86
අඩුවීම - පූර්ව ගෙවීම්	193,685.14
අඩුවීම - ලැබීමට නියමිත දෑ	(109,300.50)
අඩුවීම - පෙර වසරේ ගැලපුම්	476,644.40
විශ්‍රාම පාරිතෝෂිත බැදීම් - ගෙවූ	
ශුද්ධ මුදල් ගලන - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්	
ශුද්ධ මුදල් ගලන - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්	1,745,336.51
මුදල් ගලන - ආයෝජන ක්‍රියාකාරකම් වලින්	
පිරියත හා උපකරණ මිලදී ගැනීම	(14,177,978.50)
Adjustment	(172,628.40)
ලත් ප්‍රාග්ධන ප්‍රදාන	18,300,000.00
ශුද්ධ මුදල් ගලන - ආයෝජන ක්‍රියාකාරකම්	**3,949,393.10**
මුදල් ගලන - මූල්‍ය ක්‍රියාකාරකම් වලින්	
ශුද්ධ මුදල් ගලන - මූල්‍ය ක්‍රියාකාරකම්	
ශුද්ධ වැඩිවීම / (අඩුවීම) - මුදල් හා මුදල් වලට සමානදෑ	5,694,729.61
මුදල් හා මුදල් වලට සමාන දෑ- කාලාරම්භක	24,372,078.77
මුදල් හා මුදල් වලට සමාන දෑ - කාලාවසාන	**30,066,808.38**

මුදල් ගලන ප්‍රකාශනයේ සටහන් 1

මුදල් හා මුදල් වලට සමාන දෑ

	2017
බැංකුගත මුදල්	29,815,104.38
සුළු මුදල්	251,704.00
අතැති මුදල්	-
	30,066,808.38

විජය කුමාරතුංග අනුස්මරන රෝහල - සීදූව

ශුද්ධ වත්කම් / ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය

2017 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා

	මහාභාණ්ඩාගාර ප්‍රදාන	රාජ්‍ය ප්‍රදාන ප්‍රාග්ධන	වෙනත් පරිත්‍යාග	වි.කු.අ.රෝ. පදනම	ආයෝජන මණ්ඩලය	UDA	සංචිත-ප්‍රාග්ධන ලාභ(හිග)	ශුද්ධ අතිරික්තය	එකතුව
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	3,676,000	168,682,655	12,221,026	29,632,139	28,155,751	18,000,000	2,131,366	(51,680,118)	210,818,819
වසරේ පරිත්‍යාග			414,350						414,350
ලත් ප්‍රාග්ධන ප්‍රදාන -වසර තුළ		18,300,000							18,300,000
ලත් ප්‍රාග්ධන ප්‍රදාන - ක්‍රමක්ෂය	(1,436,000)	(23,172,621)							(24,608,621)
ශුද්ධ අතිරික්තය/හිගය - කාලය තුළ								14,269,158	14,269,158
ගත වූ වසරේ ගැලපුම්								692,664	692,664
2017.12.31 දිනට ශේෂය	2,240,000	163,810,034	12,635,376	29,632,139	28,155,751	18,000,000	2,131,366	(36,718,296)	219,886,370

Annex - 01

ස්ථාවර වත්කම් ලේඛණය - 2017 දෙසැම්බර් 31 දිනට

(Rs)

අයිතමය	පිරිවැය				අනුපාතය	ක්ෂය				31/12/2017 දිනට ලියාහැරි අගය
	1/1/2016 දිනට	වසරේ එකතුවීම්	වසරේ ඉවත්කිරීම්	31/12/2017දිනට		1/1/2016 දිනට	වසරේ එකතුවීම්	වසරේ ඉවත්කිරීම්	31/12/2017 දිනට	
ඉඩම්	26,962,353.50	197,520.00		27,159,873.50		-			-	27,159,873.50
ගොඩනැගිලි සහ සවිකිරීම්	176,264,060.70	52,810.00		176,316,870.70	2%	33,151,557.17	3,526,337.41		36,677,894.58	139,638,976.12
වාහන	17,958,792.90			17,958,792.90	20%	16,522,788.90	1,435,999.00		17,958,787.90	5.00
ලීබඩු, සවිකිරීම් සහ උපකරණ	10,404,102.05	404,476.80		10,808,578.85	10%	7,981,152.44	473,554.61		8,454,707.05	2,353,871.80
යන්ත්‍රෝපකරණ	8,821,677.26	889,528.45		9,711,205.71	15%	6,522,105.20	767,362.21		7,289,467.41	2,421,738.30
පරිඝනක	1,369,176.40	957,000.00		2,326,176.40	20%	720,405.88	370,277.28		1,090,683.16	1,235,493.24
වෛද්‍ය උපකරණ	190,424,179.39	12,466,673.25		202,890,852.64	15%	127,243,288.99	18,647,555.05	22,032.00	145,912,876.04	56,977,976.60
පුහුණු කිරීම	50,000.00			50,000.00	20%		5,000.00		5,000.00	45,000.00
එකතුව	432,254,342.20	14,968,008.50	0.00	447,222,350.70	1.02	192,141,298.58	25,226,085.56	22,032.00	217,389,416.14	229,832,934.56

229,832,934.56

සුවිශේෂී ගිණුම් ප්‍රතිපත්ති

ශෙ දු

සැකසීමේ පදනම

1.1.1 මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් පිරිවිතර වලට අනුව සකසා ඇත.

1.1.2 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය යටතේ සකසා ඇත.

1.1.3 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් සකසා ඇත.

රාජ්‍ය ප්‍රදාන

1.2 මණ්ඩලයට රාජ්‍ය ප්‍රදාන වර්ග දෙකකින් ලැබේ. ඒවා නම්
ප්‍රාග්ධන ප්‍රදාන
පුනරාවර්තන ප්‍රදාන

1.2.1 ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් පිරිවිතර වලට අනුව ගණනය කෙරේ. ප්‍රාග්ධන ප්‍රදාන වත්කම්වල භාවිත ආයුකාලය පදනම කරගත් ආදායමක් ලෙස හඳුනාගන්නා විලම්බිත ආදායම් (වාර්ෂිකව ක්ෂයවන වත්කම් වටිනාකම වසරේ ආදායමක් ලෙස ගණන් ගැනේ) ක්‍රමය තුල පිළිගැනේ.

1.2.2 පුනරාවර්තන ප්‍රදාන අදාල කාලය තුල ආදායමක් ලෙස හඳුනා ගෙන ආදායම් හා වියදම් ප්‍රකාශනයේ ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

1.3 බදු අයකිරීම

අදාළ වසර තුල අතිරික්තයක් ලබා ඇති හෙයින් මණ්ඩලය බදු සඳහා කිසිදු ප්‍රතිපාදන සැළසීමක් කර නොමැත.

1.4 සංසන්දනාත්මක තොරතුරු

මණ්ඩලය නිරතුරුව ගිණුම් ප්‍රතිපත්ති අනුව පූර්ව වසර වල අගයන් සලකමින් කටයුතු කර ඇත.

2. වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම

2.1 දේපල, පිරියත හා උපකරණ අගය ක්ෂයවීම හා ප්‍රතිඇගයුම

2.1.1 දේපල, පිරියත හා උපකරණ පිරිවැයට හෝ සමුච්චිත ක්ෂය අඩුකර ඇගයුමට දක්වා ඇත. දේපල, පිරියත හා උපකරණ වල පිරිවැය යනු ඒවා ඉදිකිරීම මිලදී ගැනීමේ පිරිවැය සමඟ වත්කම් අපේක්ෂිත භාවිතාව සඳහා පත් කිරීමට අදාළව කළ අතුරු වියදම් ඇතුළත් වේ.

සේවා ලබා දීමට හැකි වන පරිදි හෝ සේවා ධාරිතාවය වැඩිකරලීම සඳහා ප්‍රාග්ධන වියදම් සිදු කළ ස්ථාවර තත්වයේ යුතු වත්කම් වැඩිදියුණු කිරීම හෝ අත්පත් කර ගැනීම සඳහා කළ වියදම් මූලධන වියදම් වශයෙන් සලකනු ලැබේ.

2.1.2 සින්නක්කර ඉඩම් හැර වත්කම් පහත දැක්වෙන අනුපාතයට සෘජු රේඛීය ක්‍රමය භාවිතා කර පහත සඳහන් ප්‍රමාණයන්ට ක්ෂය වීම් ගණන් බලා ඇත.

ගොඩනැගිලි හා සවිකිරීම්	2%
වාහන	20%
ලීබඩු, සවිකිරීම් හා උපකරණ	10%
යන්ත්‍රෝපකරණ	15%
වෛද්‍ය උපකරණ	15%
පරිඝණක	20%

2.1.3 මිලදී ගත් වසරට හා මිලදී ගැනීමට අදාලව ක්ෂය දක්වා ඇති අතර ඉවත් කිරීමේ වසරේ කිසිදු ක්ෂය දැක්වීමක් කර නොමැත.

2.1.4 මූල්‍ය ගලන ප්‍රකාශය තුල මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස අතැති මුදල් හා බැංකුගත මුදල් ඇතුළත් වේ.

3. බැරකම් හා ප්‍රතිපාදන

3.1 ප්‍රාග්ධන බැදීම් හා අවිනිශ්චිත බැරකම්

ශේෂපත්‍ර දිනට වූ සියළු ද්‍රව්‍යාත්මක ප්‍රාග්ධන බැදීම් වියදම් වෙන්කිරීම් හා අවිනිශ්චිත බැරකම් ගිණුම් සටහන් වල දක්වා ඇත.

3.2 වට්ටෝරු භාණ්ඩ / තොග ඇගයුම

තොග පිරිවැයට ඇගයුම් කර ඇත.

4. ආදායම් හා වියදම්

4.1 ආදායම්

4.1.1 මණ්ඩලයේ ආදායම් තුල පුද්ගලික වෛද්‍ය සහතික හා රාජ්‍ය පුනරාවර්තන ප්‍රදාන සහ විවිධ ආදායම් සඳහා ගාස්තු ඇතුළත් වේ.

4.1.2 සියළු ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

4.2 වියදම

රෝගී ප්‍රතිකාර ලබා දීමට හා ප්‍රාග්ධන වත්කම් සක්‍රිය ලෙස නඩත්තු කරලීමට අදාල සියළු වියදම් වසරේ අතිරික්තය හෝ හිඟය ගණනය කිරීමේ දී උපචිත පදනම මත ආදායමට බැර කර ඇත.

ආදායම් හා වියදම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ දී, වියදම් ක්‍රමයේ ස්වභාවය මගින් අධ්‍යක්ෂක මණ්ඩලයේ කාර්යසාධනයේ මූලිකාංග ප්‍රමාණවත් වඩාහැඳිලි වන ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කරන බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

	සටහන	2017	2016
මුදල් සහ මුදල් වලට සමාන දෑ	01		
බැංකුගත මුදල්		29,815,104.38	24,223,288.77
සුළු මුදල්		-	9,140.00
අතැති මුදල්		251,704.00	139,650.00
		30,066,808.38	24,372,078.77
ලැබීමට නියමිත	02		
තැන්පත් ගිණුම		300,000.00	300,000.00
උත්සව අත්තිකාරම්		315,000.00	261,250.00
විශේෂ අත්තිකාරම්		-	-
අත්තිකාරම්		-	-
ආපදා ණය		8,059,230.10	8,003,679.60
		8,674,230.10	8,564,929.60
තොග	03		
ලිපිද්‍රව්‍ය		258,563.01	129,240.22
ඖෂධ		13,933,964.34	16,761,270.48
රසායනාගාර රසායනික ද්‍රව්‍ය		1,802,647.97	519,140.89
රෙදි වර්ග		223,124.68	207,127.18
පොදු තොග		213,113.08	174,805.44
අළුත්වැඩියා & නඩත්තු		167,612.32	202,098.32
එක්ස් රේ		679,487.43	587,533.54
දන්ත		163,001.62	55,003.12
		17,441,514.45	18,636,219.19

	සටහන	2017	2016
පූර්ව ගෙවීම්	04		
සේවා ගිවිසුම්-ඩිජිටල් කොපියර්		-	7,086.88
සේවා ගිවිසුම්-මධ්‍යම වායු සමීකරණ		-	115,898.26
සේවා ගිවිසුම්-විදුලි සෝපානය		72,000.00	65,000.00
සේවා ගිවිසුම්-විෂුවල් ෆිල්ඩ් යන්ත්‍රය		-	77,700.00
කුලී		-	-
විදුලිය- හෙද නේවාසිකාගාර		-	-
		72,000.00	265,685.14
ඉදිකිරීම් ප්‍රගතිය	05		
ඉදිකිරීම් ප්‍රගතිය - නව ගොඩනැගිල්ල		662,076.27	662,076.27
		662,076.27	662,076.27
යටිතල පහසුකම්, පිරියත හා උපකරණ	06		
යන්ත්‍රෝපකරණ		2,421,738.30	2,299,572.06
ලී බඩු		2,353,871.80	2,422,949.61
වාහන		5.00	1,436,004.00
පරිඝනක		1,235,493.24	648,770.52
වෛද්‍ය උපකරණ		56,977,976.60	63,180,890.40
පුහුණු වැඩසටහන්		45,000.00	
		63,034,084.94	69,988,186.59

		2017	2016
ඉඩම් හා ගොඩනැගිලි	07		
ඉඩම		27,159,873.50	26,962,353.50
ගොඩනැගිලි සහ සවිකිරීම්		139,638,976.12	143,112,503.53
		166,798,849.62	170,074,857.03
උපචිත වියදම්	08		
විගණන ගාස්තු		450,000.00	1,050,000.00
TKS finance		10,611.00	10,611.00
විදුලි බලය		712,103.50	1,599,703.40
දුරකතන ගාස්තු		26,772.70	65,155.12
ඉන්ධන		63,175.00	168,150.00
ගමන් වියදම්		4,431.00	30,499.00
වෛද්‍ය උපකරණ			6,886,620.00
වෛද්‍ය උපකරණ		91,145.00	
වෛද්‍ය උපකරණ අලුත්වැඩියාව		149,455.00	383,369.50
වෛද්‍ය උපකරණ-පාරිභෝජික		95,625.00	555,750.00
රසායන ද්‍රව්‍ය			1,023,225.71
යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා			26,500.00
වෙලඳ දැන්වීම්		155,376.50	126,787.50
Con. සාමාන්‍ය ඖෂධ ගබඩා			
ජලය		156,192.75	110,975.62
ලිපි ද්‍රව්‍ය			11,821.50
පස් සැපයීම			1,000,000.00
මුරකරු දීමනා			15,500.00
දම්රෝ		20,114.17	-
SLFHSU		370.00	-
SLNSS		300.00	-
විවිධ වියදම්		2,700.00	-
ගොඩනැගිලි අලුත්වැඩියා		107,413.50	-
ලිඹඩු අලුත්වැඩියා		1,510.00	-
ගෙවීමට ඇති දෑ			
ආපසු ලබා දෙන ටෙන්ඩර් තැන්පත්		378,400.00	300,950.00
රැඳවුම් මුදල		918,952.84	926,902.84
දීමනාව - බාහිර වෛද්‍යවරු		184,879.19	47,000.00
අභ්‍යාසලාභී දීමනාව - කාර්යාල කාර්යමණ්ඩල		1,058,917.05	
සිසු හෙද		344,369.53	333,229.54
සිදු පරිපූරක වෛ		175,546.69	32,891.00
උප කම්කරු පාරිශ්‍රමික		416,051.75	409,265.82
අතිකාල, අතිරේක නිරුබදු & PH ගෙවීම්		2,300,045.36	2,127,075.62
සුබසාධන සංගමය		19,067.05	6,534.52
		7,843,524.58	17,248,517.69

		2017	2016
ණය ගැතියෝ	09		
SPC		828,488.00	14,931,735.89
MSD		19,751,839.63	18,881,996.24
සීමා. සුපර් විල්෴යින්		2,530,017.78	4,209,980.48
වාම් සෙකියුරිටි		-	492,186.68
ග්‍රිජි ඉංජිනියරිං		742,543.58	1,602,371.44
එරන්දි සප්ලයර්		111,175.00	100,000.00
නලින් තුෂාර		-	240,206.00
වීරමුන්ඩ		-	70,986.18
STC		-	173,043.00
සරත් හාඩ්වෙයා		107,629.80	254,667.25
ධීවර සංස්ථාව		369,535.10	1,374,630.73
එල් ආර් ඩී සී සෙකියුරිටි සර්විසස්		1,015,600.00	-
PC Global PVt LTd		1,472,000.00	-
Delmege		165,000.00	-
Jhone Keels		155,250.00	-
Mediequipment		1,575,000.00	-
වෛද්‍ය සැපයීම් අංශය		3,722,343.05	-
		32,546,421.94	42,331,803.89

සංචිත	10		
පාරිතෝෂික ප්‍රතිපාදන		26,473,245.50	22,164,890.64
		26,473,245.50	22,164,890.64

ප්‍රාග්ධනය සහ සංචිත	11		
විජය කුමාරතුංග අනුස්මරන පදනම		29,632,139.32	29,632,139.32
ආයෝජන මණ්ඩලය		28,155,751.12	28,155,751.12
නාගරික සං.අධිකාරිය		18,000,000.00	18,000,000.00
		75,787,890.44	75,787,890.44

රාජ්‍ය ප්‍රදාන- ප්‍රාග්ධන 12

	As at 01/01/2016	Addi. Dur.i the Year	Amortization	as at 31/12/2017
රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන	168,682,655.36	18,300,000.00	23,172,621.10	163,810,034.26
වාහන - ඩබල් කැබ් රථය WPPC 4087 භාණ්ඩාගාරය	2,240,000.00			2,240,000.00
ගිලන් රථය - WPLW - 0961 සෞඛ්‍ය අමාත්‍යාංශය විසින්	1,436,000.00		1,436,000.00	-
	172,358,655.36	18,300,000.00	24,608,621.10	166,050,034.26

රාශිභූත හිඟය	13		
ඉ/ගෙ ශේෂය - 01.01.2013 දිනට		(51,680,117.76)	(49,758,280.27)
කාලසීමාව තුල අතිරික්තය		14,269,158.47	(3,091,145.89)
පූර්ව වසරේ ගැලපුම්		692,664.00	1,169,308.40
		(36,718,295.29)	**(51,680,117.76)**

	2017	2016
වෙනත් ආදායම් 14		
පුද්ගලිකවෛද්‍ය සහතික ගාස්තු	295,600.00	251,150.00
සුළු ආදායම්	529,087.00	692,770.00
ටෙන්ඩර්තැන්පත් - ආපසු නොගෙවන	217,300.00	207,000.00
ආපදා ණය පොලී	328,257.17	340,979.06
අක්ෂි සැත්කම් ගාස්තු - ප්‍රධාන	3,732,000.00	16,106,500.00
අක්ෂි සැත්කම් ගාස්තු - සුළු	50,000.00	272,000.00
සාමාන්‍යසැත්කම් - ප්‍රධාන	1,582,000.00	697,000.00
සාමාන්‍යසැත්කම් - සුළු	686,500.00	318,000.00
පොලී - විශේෂ අත්තිකාරම්	9,916.04	11,987.80
FFA ගාස්තු	2,500.00	10,500.00
FLT ගාස්තු	22,500.00	117,000.00
Periperal ගාස්තු	3,000.00	110,000.00
Abdomen ගාස්තු	2,000.00	1,000.00
YAG PI ගාස්තු	11,000.00	34,000.00
PRP ගාස්තු	23,100.00	151,900.00
HVF ගාස්තු		59,000.00
YAG CAPSULOMY ගාස්තු	691,600.00	776,300.00
OCT ගාස්තු	2,102,000.00	2,169,000.00
Grid ගාස්තු	500.00	3,500.00
Diet ගාස්තු	8,660.00	8,420.00
Endoscopy ගාස්තු	-	40,000.00
Ultrasound Scan ගාස්තු	-	37,000.00
Upper GI ගාස්තු	137,000.00	-
Sigmadcopy ගාස්තු	233,000.00	-
colonoscopy ගාස්තු	19,000.00	-
Duplex ගාස්තු	539,000.00	-
Breast ගාස්තු	33,000.00	-
PRP injection ගාස්තු	1,400.00	-
Thyroid ගාස්තු	5,500.00	-
ESD ගාස්තු	1,000.00	-
Biopcy test ගාස්තු	2,500.00	-
	11,268,920.21	22,415,006.86

	2017	2016
වියදම් 15		
පාරිශ්‍රමික, වැටුප් සහ සේවක ප්‍රතිලාභ		
වැටුප් සහ දීමනා		
වැටුප් සහ දීමනා - වෛද්‍ය නිලධාරී	36,260,788.33	35,474,847.21
වැටුප් සහ දීමනා - වෙනත්	7,524,350.94	7,394,989.78
වැටුප් සහ දීමනා - පරිපූරක	11,276,485.04	9,880,917.49
වැටුප් සහ දීමනා - හෙද	46,543,911.56	41,541,622.70
වැටුප් සහදීමනා - සුළු සේවක	36,272,048.19	34,951,368.56
E.P.F. 12%	17,670,514.54	9,544,375.08
E.T.F. 3%	2,979,620.01	2,386,095.90
අතිකාල - වෙනත්	766,268.92	660,814.97
අතිකාල - පරිපූරක වෛද්‍ය	880,036.00	644,693.76
අතිකාල - හෙද	7,261,357.50	5,988,117.50
අතිකාල - සුළු සේවක	4,470,512.61	4,454,842.25
අතිකාල ගෙවීම් වෛද්‍ය නිලධාරී	4,418,846.50	4,616,346.00
පාරිතෝෂික වියදම්	*6,177,876.74*	(6,953,031.77)
	182,502,616.88	150,585,999.43

සැපයුම් පාරිභෝජනය

	ආරම්භක තොග as at 01.01.2016	2017 මිලදී ගැනීම්	31.12.2017 දිනට අවසාන තොගය	වසරේ පාරිබෝජන 2017
රසායනාගාර රසායන ද්‍රව්‍ය	519,140.89	4,828,760.02	1,802,647.97	3,545,252.94
එක්ස් රේ පටල , රසායන ද්‍රව්‍ය	587,533.54	509,914.50	679,487.43	417,960.61
ඖෂධ	16,761,270.48	62,239,216.75	13,933,964.34	65,066,522.89
රෙදි වර්ග	207,127.18	250,764.00	223,124.68	234,766.50
පරිභෝජ්‍ය , පොදු ගබඩා	174,805.44	666,242.29	213,113.08	627,934.65
ලිපිද්‍රව්‍ය	129,240.22	615,696.54	258,563.01	486,373.75
අලුත්වැඩියා , නඩත්තු (ii)	202,098.32	145,431.00	167,612.32	179,917.00
දන්ත පාරිබෝජනය	55,003.12	109,404.45	163,001.62	1,405.95
	18,636,219.19	69,365,429.55	17,441,514.45	70,560,134.29

සැපයුම් භාවිතාව	16 2017	2016
රසායනාගාර රසායනද්‍රව්‍ය	3,545,252.94	1,763,220.83
එක්ස්රේ පටල , රසායන්ක ද්‍රව්‍ය	417,960.61	1,012,925.10
ඖෂධ	65,066,522.89	69,313,056.03
රෙදි වර්ග	234,766.50	843,409.89
පරිභෝජ්‍ය , පොදු ගබඩා	627,934.65	1,008,946.33
ලිපිද්‍රව්‍ය	486,373.75	598,026.30
අලුත්වැඩියා , නඩත්තු (11)	179,917.00	297,923.45
දන්ත පාරිබෝජනය	1,405.95	72,076.33
වෛද්‍ය උපකරණ -පරිභෝජ්‍ය	787,300.00	3,862,743.50
ගෑස්	248,707.00	282,742.00
	71,596,141.29	79,055,069.76

ක්ෂය	17		
ගොඩනැගිලි , සවිකිරීම්		3,526,337.41	3,525,281.21
වාහන		1,435,999.00	1,886,000.00
ලී බඩු, සවිකිරීම් , උපකරණ		473,554.61	530,408.96
යන්ත්‍රෝපකරණ		767,362.21	707,553.04
පරිගණක		370,277.28	199,727.28
වෛද්‍ය උපකරණ		18,647,555.05	18,490,802.29
පුහුණු වැඩසටහන්		5,000.00	
		25,226,085.56	25,339,772.78

ගමන් ගාස්තු	18		
සංයුක්ත දීමනා		90,301.00	67,529.50
ගමන් වියදම්		143,855.00	104,560.00

නඩත්තු		
විදුලි	9,195,254.58	9,551,118.02
ජල	1,441,085.84	1,575,973.97
දුරකථන	348,302.35	304,627.77
තැපැල්	31,388.00	22,818.00

		2017		2016
අලුත්වැඩියා , නඩත්තු				
අලුත්වැඩියා , නඩත්තු - ගොඩනැගිලි		656,431.64		294,834.00
අලුත්වැඩියා , නඩත්තු - යන්ත්‍රෝපකරන		1,736,733.74		2,469,568.32
අලුත්වැඩියා , නඩත්තු - වාහන		929,524.53		444,589.11
අලුත්වැඩියා , නඩත්තු - පරිගණක		12,345.00		35,679.00
අලුත්වැඩියා , නඩත්තු - වෛද්‍ය උපකරණ		1,592,433.12		2,114,874.79
අලුත්වැඩියා , නඩත්තු - ලී බඩු		104,527.00		56,119.25
කොන්ත්‍රාත්තුමය සේවා				
පිරිසිදු කිරීම		5,786,753.63		4,979,554.36
රෙදි සේදීම		666,916.00		853,387.00
ආරක්ෂක		4,520,299.99		4,025,011.74
ආහාර සැපයුම්		4,742,245.86		5,812,854.41
වෙනත්				
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ගාස්තු		54,000.00		132,250.00
සුළු වියදම්		94,432.00		212,265.46
ප්‍රචාරක දැන්වීම්		910,203.84		760,540.65
වෙනත් බැංකු ගාස්තු		34,835.00		26,465.00
විගණන ගාස්තුව		200,000.00		250,000.00
නීතිඥ ගාස්තු		-		24,200.00
කුලී		373,098.58		327,574.97
විදුලි ජනක යන්ත්‍ර ඉන්ධන		90,149.00		133,000.00
සංග්‍රහ වියදම්		55,960.00		55,086.00
මුරකරු සඳහා ගෙවීම්		174,500.00		183,000.00
NAITA පුහුණුදීමනා		250,250.00		
වාහන වියදම්				
ඉන්ධන		756,510.00		757,568.95
රක්ෂණ		262,723.41		269,613.29
ලියා./ බලපත්‍ර ගාස්තු		28,480.00		20,420.00
		35,283,539.11	-	35,865,083.56
පරිත්‍යාග ගිණුම				
ශේෂය ඉ/ගෙ	19	12,221,026.03		1,861,114.53
කාලය තුළ පරිත්‍යාග		414,350.00		10,359,911.50
		12,635,376.03	-	12,221,026.03

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්එස්එම්/බී/ඩබ්ලිව්කේඑම්එච්/1/17/13
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2018 ජූලි 31 දින.

සභාපති,

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය..

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩල පනතේ 13(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

Wijaya Kumaranatunga Memorial Hospital
09 AUG 2018
* SEEDUWA. *

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂ ගැලපීම් රු.476,644 ක් මුදල් ගලාඒම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි දක්වා තිබුණි.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුමේ ශේෂය අඩුවීම රු.15,000 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(iii) ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් ලෙස රු.172,628 ක අගයක් ඇතුළත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුලනයකර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.97,838,607 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂයකර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතුකර නොතිබුණි. තවද තාවකාලිකව අක්‍රිය වී ඇති, ක්‍රියාකාරී භාවිතයෙන් විශ්‍රාම ගන්වා ඇති හා බැහැර කිරීමට ඇති දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගැනීමට හා සාධාරණ අගය හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි.

3

(ii) ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීමට සූදානම් තත්ත්වයට ගෙනආ පසුව වුවත්, ඊට පටහැනිව වත්කම මිලදීගත් දිනය සහ ඉවත් කිරීමේ දිනය නොසලකා මිලදී ගත් වර්ෂයටම ක්ෂය කිරීම හා ඉවත් කළ වර්ෂය වෙනුවෙන් ක්ෂය නොකිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදී රාජ්‍ය ප්‍රදානයක් ලෙස ලැබී තිබුණු පිරිවැය රු.5,600,000 ක් වූ මෝටර් රථයක් 2016 වර්ෂය වන විට සම්පූර්ණයෙන්ම ක්ෂයකර තිබුණු නමුත් වාර්ෂික ක්ෂය ප්‍රමාණයට වඩා අඩු අගයකින් රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය කර තිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම මෝටර් රථය වෙනුවෙන් රු.2,240,000 ක ශේෂයක් රාජ්‍ය ප්‍රදාන ගිණුමේ ඉතිරි වී තිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.12,635,376 ක් වූ ස්ථාවර වත්කම්වල ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික ක්ෂය ප්‍රමාණය පිළිවෙලින් රු.2,409,739 ක් හා රු.1,875,023 ක් වුවද ඊට සමාන අගයකින් පරිත්‍යාග ගිණුම ක්‍රමානුකූලව ලියාහැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු.886,467 ක් වූ උපචිත සේවක භාරකාර අරමුදල් දායකය, උපචිත වායුසමීකරණ අළුත්වැඩියා වියදම් හා පුහුණු වැඩසටහන් වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගොස් නැවත කොන්ත්‍රාත් පදනම මත රෝහලේ සේවය කරනු ලබන නිලධාරීන් 6 දෙනෙකු සඳහා 2017 දෙසැම්බර් 31 දින වන විට රු.262,031 ක පාරිතෝෂික ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළ පරිගණක යන්ත්‍ර ක්ෂය රු.20,850 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) වාට්ටු 4 ක හා ශල්‍යාගාරය තුළ පැවති රු.1,343,084 ක ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය තොග භෞතික පරීක්ෂණයට ලක්කර නොතිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය ඉතිරි තොගය එම වටිනාකමින් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

2017 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබුණු භෞතික තොග සමීක්ෂණ වාර්තාවට අනුව තොගයේ පිරිවැය රු.16,579,101 ක් වුවද, තොග ලෙජරයට අනුව එම තොගයේ පිරිවැය රු.16,331,318 ක් වූයෙන් රු.247,783 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා හේතු පැහැදිලි නොකෙරුණි.

2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
මුදල් රෙගුලාසි 702 (3)	එකතුව රු.2,317,856 ක් වූ මාසික කොන්ත්‍රාත් වටිනාකමක් සහිත, නඩත්තු හා පිරිසිදු කිරීමේ සේවාව, අමු ආහාර ද්‍රව්‍ය සපයාගැනීම, ආරක්ෂක සේවය, කිලිටි රෙදි සේදීම හා හෙද නේවාසිකාගාරය සඳහා නිවසක් බද්දට ගැනීම යන සේවාවන් වෙනුවෙන් අදාළ කොන්ත්‍රාත් ආයතන සමග එළඹි ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි.
(ආ) ඖෂධ කළමනාකරණ අත්පොත	
(i) 4 පරිච්ඡේදයේ 1 හා 2 ඡේද	ඖෂධ, ශල්‍ය ද්‍රව්‍ය, රසායනාගාර ද්‍රව්‍ය හා විකිරණශීලී ද්‍රව්‍ය සඳහා සමස්ත වාර්ෂික අවශ්‍යතාවය ඇස්තමේන්තු කර නොතිබුණි.
(ii) 5 පරිච්ඡේදයේ 2 ඡේදය	ඖෂධ සැපයීමේ ක්‍රියාවලියට ගතවන මුළු කාලය (Lead time) තීරණය කර නොතිබුණු අතර අවම තොග මට්ටම, උපරිම තොග මට්ටම, යළි ඇණවුම් මට්ටම හා ආරක්ෂිත තොග මට්ටම් පවත්වා නොතිබුණි.

(iii) 5 පරිච්ඡේදයේ 3 හා 4 ඡේද	කල් ඉකුත්වීම හෝ තත්ත්වයෙන් බාලවීම හේතුවෙන් වෛද්‍ය සැපයුම් අංශය වෙත ආපසු යවන ඖෂධ පිළිබඳ කාර්තුමය වාර්තා පිළියෙලකර නොතිබුණි.
(iv) 10 පරිච්ඡේදයේ 13 ඡේදය	(i) භෞතික තොග සමීක්ෂණය විධිමත්ව සිදුකර නොතිබුණු බැවින් තොග අතිරික්තතා හා ඌනතා, සෙමින් චලනය වන, චලනය නොවන, කල් ඉකුත්වීමට ආසන්න හා කල් ඉකුත් වූ ද්‍රව්‍ය අනාවරණය කර ගෙන නොතිබුණි. නමුත් තොග පොත්වලට අනුව 2017 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.1,011,606 ක් වූ සෙමින් චලනය වන ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 37 කට අයත් ඒකක 374,473 ක් හා පිරිවැය රු.528,047 ක් වූ චලනය නොවන ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 18 කට අයත් ඒකක 7,773 ක් විය.
	(ii) තොග පොත් අනුව, වාට්ටු 4 ක හා ශල්‍යාගාරය තුළ 2017 දෙසැම්බර් 31 දිනට පැවති පිරිවැය රු.1,343,004 ක් වූ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය තොග භෞතික සමීක්ෂණයට ලක් කර නොතිබුණි.
	(iii) භෞතික තොග සමීක්ෂණ වාර්තා, සමීක්ෂණ මණ්ඩලයේ සියලුම සාමාජිකයන් විසින් අත්සන් කර නොතිබුණු අතර සමීක්ෂණය සිදුකළ අංශය භාර නිලධාරියාගේ නම, දිනය හා අත්සන යොදා සහතික කරවාගෙන නොතිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

රෝහල් අධ්‍යක්ෂගේ අනුමැතියකින් තොරව මුළු පිරිවැය රු.283,310 ක් වූ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 10 ක් වෙනත් රජයේ රෝහල් 3 ක් වෙත ප්‍රධාන ඖෂධවේදී විසින් නිකුත්කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආරෝග්‍යශාලා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.14,269,158 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,091,146 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,360,304 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් රු.23,762,457 කින් වැඩි වී තිබුණද රාජ්‍ය ප්‍රදාන රු.53,000,000 කින් වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2013 හා 2014 වර්ෂවල පිළිවෙලින් රු.20,378,939 ක ඌනතාවයක් හා රු.3,558,018 ක අතිරික්තයක් වී තිබුණු අතර 2015 හා 2016 වර්ෂවල පිළිවෙලින් රු.20,023,884 ක හා රු.3,091,146 ක ඌනතාවයක්ද 2017 වර්ෂයේදී රු.14,269,158 ක අතිරික්තයක්ද ඇතිවී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.68,464,933 ක් වූ දායකත්වය 2017 වර්ෂය වන විට රු.177,372,828 දක්වා අඛන්ඩව වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වන පරිච්ඡේදයේ 5.1.2 ඡේදය ප්‍රකාරව, ආයතනයේ සංවිධාන සැලැස්ම, ආයතනයේ ශක්තිය, දුර්වලතා, බාහිර තර්ජන හා අවස්ථා පිළිබඳ විශ්ලේෂණය (SWOT Analyses), අරමුණුවලට ගැලපෙන පරිදි අදාළ කාලසීමාව තුළ ළඟාවීමට අපේක්ෂිත ඉලක්ක හා ඒ සඳහා ක්‍රියාත්මක උපායමාර්ග 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර තිබුණද, ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අදාළ ක්‍රියාකාරකම් ඊට ඇතුළත්කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී රු.13,147,004 ක් වැයකර වෛද්‍ය සැපයුම් අංශය වෙතින් මිලදී ගැනීමට සැලසුම්කර තිබුණු ඖෂධ, ශල්‍ය ද්‍රව්‍ය, රසායනාගාර ද්‍රව්‍ය සහ විකිරණ ද්‍රව්‍ය වර්ග 158 ක ඒකක 851,287 කින් එක් ඒකකයක් හෝ මිලදී ගෙන නොතිබීම හා මිලදී ගැනීමට ඇස්තමේන්තු නොකරන ලද ද්‍රව්‍ය වර්ග 125 කින් ඒකක 461,792 ක් මිලදී ගැනීම සඳහා රු.32,084,042 ක් වැයකර තිබීම යන කරුණු හේතුවෙන් අවශ්‍යතාව පිළිබඳ අවබෝධයකින් හෝ අධ්‍යයනයකින් තොරව අදාළ ඇස්තමේන්තුව පිළියෙලකර තිබුණු බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් ඇස්තමේන්තුගත වියදම රු.39,699,740 ක් වුවද එය සියයට 58 කින් ඉක්මවා තිබුණු අතර වැයකර තිබුණු තථ්‍ය වියදම රු.62,654,007 ක් විය.

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාරලත් රෝගීන්, සායන සඳහා පැමිණි රෝගීන් හා නේවාසික රෝගීන් සංඛ්‍යාව පිළිවෙලින් සියයට 11 කින්, සියයට 14 කින් හා සියයට 48 කින් අඩු වී තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබුණු අක්ෂි ශල්‍යකර්ම හා සුළු අක්ෂි ශල්‍යකර්ම සංඛ්‍යාව පිළිවෙලින් සියයට 81.72 කින් හා 33.46 කින් අඩු වී තිබුණි. එසේම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබුණු ලේසර් පරීක්ෂණ සංඛ්‍යාව, X-ray පරීක්ෂණ සංඛ්‍යාව හා Refraction Service පිළිවෙලින් සියයට 50 කින්, සියයට 49 කින් හා සියයට 41 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී කායික විශේෂඥ වෛද්‍යවරයා හා අක්ෂි ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයා සේවයෙන් ඉවත්ව තිබුණු නමුත් එම තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 35 ක් වූ කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩ පහසුකම් වැඩි කිරීමේ ව්‍යාපෘතිය මගින්, වෛද්‍ය සායන, දන්ත සායන හා බාහිර රෝගී රසායනාගාරය සඳහා ඉඩ පහසුකම් වැඩි කිරීම මෙන්ම බාහිර අංශයේ රෝගීන්ට වාතාශ්‍රය සහිත රැඳී සිටීමේ පහසුකම් ඇති කිරීමට සැලසුම්කර තිබුණද නිසි සැලසුමකට අනුව කටයුතු කර නොතිබීම හේතුවෙන් ඇස්තමේන්තු මුදල ප්‍රමාණවත් නොවීම නිසා 2018 මැයි 31 වන විට එම ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙලකර තිබුණු සංයුක්ත සැලැස්ම ප්‍රකාරව, රු.24,700,000 ක් වටිනා වෛද්‍ය උපකරණ 4 ක් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී

ගැනීමට සැලසුම්කර තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විටත් එහි ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර හෝ නොතිබුණි. තවද ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව, රු.4,000,000 ක් වැයකර ශල්‍යාගාර ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට සැලසුම්කර තිබුණු නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා ප්‍රමාණ පත්‍ර හා ඇස්තමේන්තු පිළියෙල කිරීම පමණක් සිදුකර තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

රෝහල් මණ්ඩලයේ අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව පහත සඳහන් යන්ත්‍ර මිලදී ගැනීම හේතුවෙන් ඒවා ඌන උපයෝජිතව පැවතුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේදී රු.2,500,000 ක් වැය කර, පැයකට අවම වශයෙන් පරීක්ෂණ ඒකක 60 ක අධි ධාරිතාවයක් සහිත Fully Automated Hematology Analyzer යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණද, 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ වර්ෂවලදී පිළිවෙලින් පැයකට පරීක්ෂණ ඒකක 17 ක්, පැයකට පරීක්ෂණ ඒකක 9 ක් හා පැයකට පරීක්ෂණ ඒකක 20 ක් පමණක් සිදුකර තිබුණි.

(ආ) 2013 වර්ෂයේදී රු.8,736,000 ක් වැයකර පරීක්ෂණ වර්ග 21 ක් හා පැයකට අවම වශයෙන් පරීක්ෂණ ඒකක 300 ක් සිදුකළ හැකි අධි ධාරිතාවයක් සහිත Fully Automated Biochemistry Analyzer යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණද, ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂණ වර්ග 12 ක් පමණක් සිදුකර තිබුණු අතර පිළිවෙලින් පැයකට පරීක්ෂණ ඒකක 25 ක් හා පරීක්ෂණ ඒකක 34 ක් පමණක් සිදුකර තිබුණි.

(ඇ) 2005 වර්ෂයේ සිට 2016 වර්ෂය අතර කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සිටි සේවකයින් 55 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් නියමිත කාලය තුළදී ප්‍රේෂණය කර නොතිබීම හේතුවෙන් එම කාලපරිච්ඡේදයට අදාළව එම අරමුදල් වෙත දායක මුදල් ලෙස රු.1,533,879 ක්ද, අධිභාර ලෙස රු.2,204,066 ක්ද වශයෙන් මුලු මුදල රු.3,737,945 ක් රෝහල් මණ්ඩලයට ගෙවීමට සිදුවී තිබුණි.

(ඈ) X - Ray Films පවතින තොගය හා පාරිභෝජනය වන ප්‍රමාණය නිවැරදිව හඳුනා නොගෙන අවශ්‍යතාවය ඉක්මවා මිලදීගෙන තිබීම හේතුවෙන් 2018 මාර්තු 01 දින වන විට පිරිවැය රු.330,426 ක් වූ X - Ray Films 5,006 ක් කල් ඉකුත්වී තිබුණි.

9

4.3 ඔබෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2017 වර්ෂය සඳහා නඩත්තු හා පිරිසිදු කිරීමේ සේවාව ලබාගැනීමේ කොන්ත්‍රාත් ගිවිසුමේ 13 ඡේදය ප්‍රකාරව, සේවාව උසස් තත්වයෙන් සිදුකළ බවට ඒ ඒ අංශ හා වාට්ටු භාර නිලධාරීන්ගෙන් සහතිකයක් ලබා ගත යුතු වුවද එසේ ලබා නොගෙන සමාලෝචිත වර්ෂයට අදාළව පිරිසිදු කිරීමේ සේවාව වෙනුවෙන් රු.2,812,680 ක් ගෙවා තිබුණි.

(ii) රෝහලට අමු ආහාර සපයා ගැනීම හා රෝගීන්ට ආහාර ලබාදීම සම්බන්ධයෙන් නිකුත් කර තිබුණු 2015 මැයි 28 දිනැති හා අංක 01 - 21/2015 දරන සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. ඒ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) යථෝක්ත චක්‍රලේඛයේ 5.1.3 හා 5.1.4 ඡේද ප්‍රකාරව, සති ආහාර වැඩසටහන පිළියෙල කිරීමට ආයතන ප්‍රධානියා විසින් ආහාර කළමනාකරණ කමිටුවේ සහාය ලබාගැනීම, පිළියෙල කරනු ලබන සති ආහාර වැඩසටහන අදාළ අංශ වෙත ලබාදීම හා එළවළු සැපයීමේ මාසික වැඩසටහනක් පිළියෙල කිරීම සිදුකර නොතිබුණි.

(ii) යථෝක්ත චක්‍රලේඛයේ 7.5 හා 7.7 ඡේද ප්‍රකාරව, උදෑසන වාට්ටුවලට යන වෛද්‍ය නිලධාරීන් විසින් සෑම රෝගියෙකුටම යෝග්‍ය ආහාර වටයක් ඇඳ ඉහපතෙහි සටහන් කිරීම හා අමතර ආහාර පිළිබඳ අවශ්‍යතාවය අනුව ඇඳ ඉහපතෙහි සටහන්කර එය පෞද්ගලිකවම සහතික කිරීමට කටයුතුකර නොතිබුණි.

(iii) යථෝක්ත චක්‍රලේඛයේ 8.1.1, 8.1.3 හා 8.1.4 ඡේද ප්‍රකාරව, සෑම මාසයකම පළමුවනදා නේවාසික රෝගීන් වෙනුවෙන් සෞඛ්‍ය 31 ආකෘති පත්‍රයට අනුව වාට්ටුව සඳහා වෙනම අළුත් ආහාර වට පත්‍රිකාවක් පිළියෙල කිරීමට, අදාළ නිලධාරීන් විසින් ඇඳ ඉහපත් පරීක්ෂාකර ආහාර වට පත්‍රිකාවේ නියමිත ආහාරය සටහන් කිරීමට, එක් එක් රෝගීන්ගේ ආහාර වට සාරාංශකර දවසට අවශ්‍ය ආහාර වට ප්‍රමාණය ගණනය කිරීමට හා එය සිටින රෝගීන් සංඛ්‍යාව සමඟ සැසඳීමට කටයුතු කර නොතිබුණි.

(iv) යථෝක්ත චක්‍රලේඛයේ 10.5, 10.10 හා 11.7 ඡේද ප්‍රකාරව, පිසූ ආහාර ඉතිරිව අපතේ යාම පිළිබඳ පරීක්ෂාකර ඒ අනුව අමු ආහාර යම් ප්‍රතිශතයක් අඩුකර ඇණවුම් කිරීමට, ප්‍රසම්පාදන කමිටුව අනුමතකර ඇති මාසික උපරිම

සැපයුම් සීමාව තුළ ආහාර ද්‍රව්‍ය ඇණවුම් කිරීමට හා ඒ සම්බන්ධ විධිමත් පාලනයක් පවත්වා ගැනීමට කටයුතුකර නොතිබුණි.

(v) යථෝක්ත චක්‍රලේඛයේ 14.1, 15.1 හා 15.3 ඡේද ප්‍රකාරව, පිසිනා ලද ආහාර ද්‍රව්‍ය බෙදීමට පෙර නිදර්ශන පෙන්වීමට, රෝහල් සේවකයින් ආහාර කාඩ්පත් අනුව ආහාර ලබාගන්නා බව පරීක්ෂාකාරීවීමට හා නියමිත ආහාර ප්‍රමාණය පමණක් සේවකයන්ට ලබාදෙන බව තහවුරු කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(vi) යථෝක්ත චක්‍රලේඛයේ 17 උපලේඛනය ප්‍රකාරව, රජයට අවම පිරිවැයක් වැය වන ආකාරයට අමු ආහාර ද්‍රව්‍ය ඇණවුම් කිරීම, ලබාගැනීම, පිසීම හා බෙදාහැරීම පිළිබඳ කළමනාකරණය සඳහා ආහාර කළමනාකරණ කමිටුවක් පත්කර නොතිබුණි.

4.4 අරමුදල් ඌන උපයෝජනය

සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍ය උපකරණ මිලදී ගැනීම හා ශල්‍යාගාරය අළුත්වැඩියා යන ප්‍රාග්ධන වියදම් සඳහා රු.18,300,000 ක් රාජ්‍ය ප්‍රදාන ලෙස ලැබී තිබුණු නමුත්, එම කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණු බැවින් ඉන් රු.15,000,000 කට අධික මුදලක් ඉතිරි වී තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන වියදම් සඳහා වූ මුදල් පොතට අනුව ඉතිරිවී තිබුණු මුළු රාජ්‍ය ප්‍රදාන ශේෂය රු.28,361,382 ක් විය.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රෝහලේ අනුමත කාර්ය මණ්ඩලය 250 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 210 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3.1 ඡේදය ප්‍රකාරව ආරෝග්‍යශාලා මණ්ඩලය සඳහා අනුමත කිසිදු තනතුරක් වෙනුවෙන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි පිළියෙල කර නොතිබුණි.

(ආ) අනුමත ලියාපදිංචි වෛද්‍ය නිලධාරි තනතුරු සංඛ්‍යාව 02 ක් හා තථ්‍ය සංඛ්‍යාව 03 ක් වුවද අතිරික්ත තනතුර සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) රෝහලේ ප්‍රධාන තනතුරු 7 ක් සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2016 මාර්තු 14 දින අනුමතකර තිබුණද එම තනතුරුවල පවතින පුරප්පාඩු 21 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පිරවීමට කටයුතු කර නොතිබුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" පිළිබඳව ආරෝග්‍යශාලා මණ්ඩලය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

6.1 විගණන කමිටු

2010 දෙසැම්බර් 14 දිනැති හා අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව, අවම වශයෙන් මාස 3 කට වරක් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා එක් විගණන කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

6.2.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.27,952,476 ක් වූ නඩත්තු හා පිරිසිදු කිරීමේ සේවාව, අමු ආහාර ද්‍රව්‍ය සපයා ගැනීම, ආරක්ෂක සේවය, කිලිටි රෙදි සේදීම හා හෙද නේවාසිකාගාරය සඳහා නිවසක් බද්දට ගැනීම යන සේවාවන් ලබාගෙන තිබුණු අතර, එම සේවාවන් ලබාගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයන් වලදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2 (ආ) හා (ඇ) ඡේදය, 2.11.3 ඡේදය, 2.12 (අ) ඡේදය, 3.12.2 (i), (ii) හා (iii) ඡේද, 5.3.1 (අ) (ඇ) දක්වා වූ ඡේද, 5.3.2 ඡේදය හා 6.3.6 ඡේදය ප්‍රකාරව, පිළිවෙලින්

(i) ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් පරීක්ෂාව හා ඒවා සමාලෝචනය කිරීම හා අනුමත කිරීම මෙන්ම පිරිවිතර ඇතුළු ලංසු ලේඛන කෙටුම්පත් සැකසීම හා ඒවා අනුමත කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත්කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා නිශ්චිත ආකෘතියට අනුව වාර්තාගත කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් විසින් රහස්‍යභාවය හා අපක්ෂපාතීත්වය පිළිබඳ ප්‍රකාශයක් ලබාදී නොතිබුණි.

(iv) පූර්ව සුදුසුකම් පරීක්ෂාවේ උපමාන නිශ්චිතව හඳුනාගැනීම සහ සාර්ථකව කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමට ලංසුකරුවන් වෙත ඇති හැකියාව තීරණය කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ලංසු ආරාධනාවේ ඇතුළත්කර නොතිබුණි.

(v) රෝහල් මණ්ඩලය විසින් සම්මත ලංසු කැඳවීමේ ලේඛනවල යෝග්‍ය ආදර්ශයක් භාවිතාකර නොතිබුණු අතර සම්මත ලංසු කැඳවීමේ ලේඛන වෙනුවට භාවිතා කරනු ලබන ලංසු ලේඛනවල යෝග්‍යතාවය පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව පරීක්ෂාකර අනුමතකර නොතිබුණි.

(vi) ජයග්‍රාහී ලංසුකරුට තිබිය යුතු සෘජුවම සුදුසු බව තහවුරු කෙරෙන උපමාන හා සුදුසුකම් ඇතුළත්ව ලංසු ආරාධනාව පිළියෙලකර නොතිබුණි.

(vii) ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘතියට අනුව වාර්තාකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා රෝහලේ අමු ආහාර ද්‍රව්‍ය සපයා ගැනීමේ වාර්ෂික කොන්ත්‍රාත් වටිනාකම එකතුකළ අගය මත බදු රහිතව රු.15,553,860 ක් වූ නමුත් සත්‍ය වාර්ෂික වියදම රු.3,848,913 ක් විය. මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මාසික අමු ආහාර ද්‍රව්‍ය අවශ්‍යතාවය ප්‍රමාණය ඉක්මවා ඇස්තමේන්තු කර ලංසු කැඳවා තිබීම හේතුවෙන් වැඩි ලංසුකරුවන් සංඛ්‍යාවකගෙන් ලංසු ලබාගත හැකිවීමේ අවස්ථාව මඟහැරී තිබුණු අතර රෝහලේ වාර්ෂික සත්‍ය අවශ්‍යතාවයට වඩා සියයට 75 කින් වැඩි අගයකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ii) ලංසු ඇගයීමේදී ආහාර ද්‍රව්‍යවල වෙළඳපල මිල දර්ශකය අනුව සම්මත මිල පදනම් කරගෙන ඇගයීම් කර තිබුණද ඇතැම් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා, තෝරාගත් ලංසුකරුගේ මිල ගණන් සම්මත මිල ඉක්මවා තිබුණු නමුත් ඒ පිළිබඳ තාක්ෂණ ඇගයීම් කමිටුවේ අවධානය යොමුවී නොතිබුණි. වියළි ආහාර ද්‍රව්‍ය 10 ක් පිළිබඳ නියැදි පරීක්ෂාවේදී, මිල ඉක්මවීම සම්මත මිලට සාපේක්ෂව සියයට 14 සිට සියයට 53 දක්වා පරාසයක පැවතුණි.

13

6.12 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

කොන්ත්‍රාත් වටිනාකම රු.12,431,157 ක් වූ රෝහලේ රසායනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ විධිමත් දින දීර්ඝ කිරීම් සහිත කොන්ත්‍රාත් කාලය දින 300 ක් වුවද, දින 412 ක කාලයක් ගතකර තිබුණි. ඒ අනුව ප්‍රමාද දින 112 ක් සඳහා ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව දිනකට රු.6,000 බැගින් රු.672,000 ක ප්‍රමාද ගාස්තු අය කර ගත යුතු වුවද, එසේ ප්‍රමාද ගාස්තු අයකිරීමකින් තොරව කොන්ත්‍රාත්කරුගේ බිල්පත් සඳහා සියයට දහයක රඳවාගැනීම් හැර සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි.

6.3 අයවැය පාලනය

විෂයයන් 15 කට අදාළ අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 51 සිට සියයට 141 දක්වා විචලනයන් පැවතීම හා වැය විෂයයන් 4 ක් සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමෙන් තොරව රු.609,325 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබීම ආදී වූ හේතූන් මත අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආරෝග්‍යශාලා මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු විය යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පාලනය	ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, ඉදිකිරීම් කොන්ත්‍රාත් කාර්යයන් ඉටුකරවා ගත හැකි වන ලෙස මනා අධීක්ෂණයක් සිදුකර නොතිබීම, උපරිම කාර්ය සාධනයක් ලබා ගැනීමට කටයුතුකර නොතිබීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනයකර නොතිබීම.
(ආ) ඖෂධ තොග ගබඩා පාලනය	තොග අවශ්‍යතාවය හඳුනාගැනීමේ සිට තොග ලැබීම් හා නිකුත් කිරීම් ලේඛනගත කිරීම සහ ගිණුම්ගත කිරීම දක්වා ක්‍රියාවලිය සඳහා ප්‍රමාණවත් හා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා ගැනීමට කටයුතුකර නොතිබීම හා භෞතික තොග සමීක්ෂණ කටයුතු විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබීම.

(ඇ) ගිණුම්කරණය

ඖෂධ තොග පාලන ගිණුම් පවත්වා නොතිබීම හා ජර්නල් සටහන් භාවිතයෙන් තොරව ගැලපීම් සිදු කිරීම.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

15